SJSW 2022 2(1) : 01-12

Student Journal of Social Work (SJSW)
Volume 02 – Issue 01

# කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ පාසැල් ළමුන්ට හා ස්වයං රැකියාවන් හි නියුතු වුවන්ගේ පවුල් ඒකකවලට සිදු කර ඇති බලපෑම හා ඒ සඳහා සමාජ වැඩ මැදිහත්වීම පිළිබඳ ව සමාලෝචනයක් සිදු කිරිම.

**Dhananjaya.R.**[1]

[1] School of Social Work, National Institute of Social Development, Liyanagemulla, Seeduwa, Sri Lanka

**සංක්ෂිප්තය**

කොරෝනා වෛරසය පැතිරීම මුලින්ම වාර්තා වූයේ වර්ෂ 2019 දෙසැම්බර් 31 දින චීනයේ හුබෙයි පළාතේ වූහාන් නගරයෙනි. වර්ෂ 2020 ජනවාරි 30 වන දින ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් නව කොරෝනා වෛරසය ජාත්‍යන්තර වශයෙන් අවධානය යොමු කළ යුතු මහජන සෞඛ්‍ය පිළිබඳ හදිසි අවස්ථාවක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද අතර වර්ෂ 2020 මාර්තු මස 11 වන දින එය වසංගතයක් වශයෙන් ප්‍රකාශයට පත් කරන ලදි. ලොව පුරා ඉතා සිඝ්‍රයෙන් පැතිරි ගිය මෙම වසංගතය ශ්‍රී ලංකාවේ මිනිස් සමාජය වෙත සම්ප්‍රේෂණය වීමට ගත වුයේ ඉතා කෙටි කාලයකි. ශ්‍රී ලංකාවේ කොරෝනා වෛරසය ව්‍යාප්ත විම ආරම්භයේ දි රජය විසින් රට තුළ ඇදිරි නිතිය පනවා ජනතාව නිවෙස් තුළට සිමා කිරිමට ගත් පියවර යම් මට්ටමකින් සාර්ථක විය. නමුත් කොවිඩ්-.19 අර්බුදය මගින් රටේ අධ්‍යාපන පද්ධතිය තුළ බොහෝ අඩුපාඩුකම් සහ විෂමතාවයන් පවතින බව පෙන්වා දී ඇත.

**කේන්ද්‍රීය පදඃ** කොවිඩ් වසංගත, පාසැල් ළමුන්, සමාජ වැඩ මැදිහත්වීම

## හැඳින්වීම

චීනයෙන් ආරම්භ වූ කොරෝනා වෛරසය මුළු මහත් ලෝකවාසීන් භීතියට පත් කරමින් ලොව පුරා සිසුයෙන් ව්‍යාප්ත වන්නට විය. ශ්‍රී ලංකාව ද මෙම වසංගතයෙන් පීඩාවට පත්ව සිටින අතර මේ වන විට ලක්ෂ 05කට අධික ජනතාවක් මෙම මරාන්තික කොවිඩ් උවදුරට ගොදුරු විය. 14000 කට ආසන්න සංඛ්‍යාවක් ජීවිතක්ෂයට පත් විය. මෙම වෛරසය පුද්ගලයාගෙන් පුද්ගලයාට ඉතා සිසුයෙන් සම්ප්‍රේෂණය වන බැවින් සහ ගෝලීය වශයෙන් සිදු කර ඇති බරපතල අවදානම් තත්ත්වය හමුවේ ලෝක සෞඛ්‍ය සංවිධානය කොවිඩ් වෛරසය ගෝලීය වසංගත තත්ත්වයක් ලෙස නම් කරනු ලැබිය. ලොව පුරා ඉතා සිසුයෙන් පැතිරී ගිය මෙම වසංගතය ශ්‍රී ලංකාවේ මිනිස් සමාජය වෙත සම්ප්‍රේෂණය වීමට ගත වූයේ ඉතා කෙටි කාලයකි. ශ්‍රී ලංකාවේ කොරෝනා වෛරසය ව්‍යාප්ත වීම ආරම්භයේ දී රජය විසින් රට තුළ ඇඳිරි නීතිය පනවා ජනතාව නිවෙස් තුළට සීමා කිරීමට ගත් පියවර යම් මට්ටමකින් සාර්ථක විය. මෙයට අමතරව රෝග මර්ධනය කිරීම අරමුණ පෙරදැරිව කොවිඩ් මර්ධන කාර්ය සාධක බලකායක් ස්ථාපිත කර අවශ්‍ය කටයුතු සිදු කිරීමට පියවර ගන්නා ලදි. මේ අනුව වීසා නිකුත් කිරීම තාවකාලිකව නතර කිරීම, ගුවන් ගමන් සේවා තාවකාලිකව අත්හිටුවීම, පොදු ස්ථාන සහ මහජන ප්‍රවාහන සේවා විෂබීජහරණය කිරීම සහ අඩු ආදායම්ලාභී මෙන්ම දෛනිකව වැටුප් ලබන ජනතාව සඳහා සහන පැකේජයක් හඳුන්වා දීම වැනි කරුණු ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ අතර මෙම වසංගතයෙන් ආරක්ෂාවීමට නිරන්තරයෙන් සෞඛ්‍ය උපදෙස් පිළිපදිමින් කටයුතු කළ යුතු බව සෞඛ්‍ය අමාත්‍යාංශය ප්‍රමුඛ සෞඛ්‍ය බලධාරීන් ජනතාව දැනුවත් කරන ලදි. ඒ අනුව සමාජ දුරස්ථභාවය, දෑත් සේදීම, මුව ආවරණ පැළඳීම වැනි සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේදයන් අනුගමනය කිරීමට ජනතාව උනන්දු කරන ලදි. නමුත් ජනතාව මේ සම්බන්ධයෙන් දැක්වූ නිද්‍රාශීලි ප්‍රතිපත්තිය හමුවේ සහ දැඩිව තම සෞඛ්‍ය උපදෙස් අනුගමනය නොකිරීම හේතුවෙන් කොරෝනා වෛරසය ශ්‍රී ලංකාව තුළ දිගින් දිගටම පැතිර යාමට හේතු විය. මේ අනුව සංචරණ සීමා පැනවීම සහ ඇතැම් ප්‍රදේශ ලොක්ඩවුන් කිරීමට පවා රජයට සිදු විය. මෙමඟින් සමාජයේ බොහෝ පිරිසක් තම සෞඛ්‍යාරක්ෂාව සඳහා අවධානය යොමු කළ අතර ඇතැම් පිරිස් ඒ සම්බන්ධයෙන් කිසිඳු උනන්දුවක් නොදැක්වීම කණගාටුවට කරුණකි.

කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ ගම්පහ ප්‍රදේශයේ පාසැල් ළමුන්ට හා ස්වයං රැකියාවන් හි නියුතු වූවන්ගේ පවුල් ඒකකවලට සිදු කර ඇති බලපෑම පිළිබඳව විමර්ශනයක් සිදු කිරීමට මෙමඟින් බලාපොරොත්තු වන අතර මොවුන්ගේ ගැටළු විසඳීම සඳහා සමාජ වැඩ ප්‍රවේශයන් භාවිතා කළ යුතු ආකාරය පිළිබඳව යම් විමර්ශනයක් සිදු කරමි. කෙසේ වෙතත් කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ සමාජ විද්‍යාවේ සහ සමාජ වැඩ භූමිකාවේ විවිධ පැතිකඩයන් ඔස්සේ න්‍යාත්මක සහ ගුණාත්මක දත්ත රැස් කිරීමක් සිදු කර ඇත.

## පාසැල් ළමුන්ට හා ස්වයං රැකියාවන් හි නියුතු වූවන්ගේ පවුල් ඒකකවලට සිදු කර ඇති බලපෑම

කොරෝනා වසංගතය පාසැල් අධ්‍යාපනය සඳහා ප්‍රබල තර්ජනයක් ඇති කළේය. ලොව පුරා බිලියන 2000කට ආසන්න දරුවන්ගේ සහ තරුණයන්ගේ අධ්‍යාපනය කෙරෙහි මෙමඟින් බලපෑම් එල්ල විය. යුනෙස්කෝ සංවිධානයේ නිරීක්ෂණයට අනුව ලොව පුරා රටවල් 189 ක පාසැල් තාවකාලිකව වසා දැමීමට සිදු වී ඇත. එය ලෝක ශිෂ්‍ය ජනගහනයෙන් 98% ක් බව පෙන්වා දී තිබේ. පාසැල් වසා දැමීම මඟින් සිසුන්ට සහ ගුරුවරුන්ට මෙන්ම ඔවුන්ගේ පවුල්වලට පමණක් නොව ආර්ථික හා සමාජීය ප්‍රතිවිපාක පුළුල් ලෙස ඇති කරනු ලැබීමට හේතුවක් වී ඇත. කොවිඩ් වසංගතය හමුවේ කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට මෙන්ම සුළු කර්මාන්තවලට ඉතාමත් දරුණු ලෙස බලපෑම් එල්ල වී ඇත. ස්වයං රැකියාවල නියුතු

වුවන් සියළුදෙනාගේ සිය ජීවනෝපාය අහිමිවී ඇත. ලාංකිය සමාජය දෙස නිරීක්ෂණය කිරීමේ දී බොහෝ ස්වයං රැකියාවන් හි නියුක්තවූවන් තම ආදායම සපයා ගන්නේ විවෘත ආදායම් මාර්ගවලට යොමු වීමෙනි. උත්සව ආශ්‍රයෙන් තම ආදායම ලබා ගන්නා මොවුන් සිංහල අවුරුදු සමය, වෙසක් සහ දීපවාලි කාල පරිච්ඡේදය මෙන්ම නත්තල් සමයේ තම වෙළදාම් සිදු කරනු ලබයි. ජනවාරි සිට මාර්තු දක්වා වූ කාලය තරමක අඩු ආදායමක් මොවුන් ලබයි.

වර්තමානය වන විට කොරෝනා වෛරසය මිනිස් ජිවිතවල නව පිටුවක් පෙරලෙමින් සිටියි. තාක්ෂණය වඩාත් ඉදිරිගාමී ලෙස ලාංකීය සමාජය තුළ තිරණාත්මක සාධකයක් බවට පත් වී තිබේ. ලෝකය පුරා මෙම වෛරසය පැතිරීමත් සමඟ මිනිසා භෞතිකව දුරස් වෙමින් තාක්ෂණය පෙරටත් වඩා මිනිස් ජිවිතවලට සමිප වි තිබේ. කොරෝනා ව්‍යසනය සමඟ අධ්‍යාපනයට ද කිසියම් ආකාරයක ඉදිරි පියවරක් තබන්නට සිදු විය. ඒ මාර්ගගත අධ්‍යාපන ක්‍රමවේදයයි.  ළමා පරපුර රටක ජීවනාලිය වේ. ගෝලීය කොරෝනා වසංගතය සමඟ පෙර පාසැල් අධ්‍යාපනයේ සිට විශ්වවිද්‍යාල අධ්‍යාපනය දක්වා වූ සිසු පරපුරට එල්ල වි ඇති අභියෝග බොහෝමයක් වේ. මේ වන විට ඇතැම් සිසුන් අන්තර්ජාල අධ්‍යාපනයට පිවිස සිටියත් සෑම සිසුවෙක්ම මෙම පහසුකම එක ලෙස භාවිතා නොකරයි. ගම්පහ ප්‍රදේශයේ ජිවත්වන පාසැල් සිසුන් ද මෙම අභියෝගයට මුහුණ දි සිටියි. ඒ සඳහා ඔවුන්ගේ ආර්ථික සහ සමාජ මට්ටම බලපානු ලබයි. පාසැල් දරුවන්ට ඒ සඳහා අවශ්‍ය අධ්‍යාපනික සහ තාක්ෂණික පසුබිම මෙන්ම පෙළ පොත් ලබා ගැනිමේ ගැටළුව ද පවතියි. නිවසේ සිට අන්තර්ජාලයට සම්බන්ධ විමට හැකියාව ඇත්තේ සිමිත පිරිසකට පමණි. සමහර විට ඒ සඳහා අවැසි තාක්ෂණික මෙවලම් නොතිබිම ප්‍රධාන ගැටළුවක් වේ. අන්තර්ජාල මාර්ගගත අධ්‍යාපන ක්‍රමවේදය මගින් ආදාළ දේශන සටහන් සහ පැවැරම් අභ්‍යාස ගුරු භවතුන් දරුවන් වෙත යොමු කරන අතර ඒවා මුද්‍රිත පිටපත් වශයෙන් ලබා ගැනිමට ද දරුවන්ට සිදු වි තිබේ.

නාගරික සමාජයේ ජිවත්වන පවුල් ඒකකයන් යම් ආකාරයකින් මෙම ගැටළුව සඳහා මුහුණ දි සිටියත් ග්‍රාමිය වශයෙන් ජිවත් වන පවුල් ඒකකයන් තුළ පවතින ආර්ථික ගැටළු හමුවේ තම දරුවන්ට අවැසි අධ්‍යාපන පසුබිම ලබා දිමට නොහැකි වි දෙමව්පියන් අසරණව සිටිනු දැක ගත හැකි වේ. සමාන්‍ය පෙළ සහ උසස් පෙළ හදාරන දරුවන් විශාල සංඛ්‍යාවක් සිටින ගම්පහ ප්‍රදේශයේ කොවිඩ් වසංගතය නිසා පැන නැගි ඇති ආර්ථික දුෂ්කරතා හමුවේ වැඩිමහල් පාසැල් දරුවන් පාසැල හැර යමින් පවතියි. ඇතැමෙක් ඔවුන්ගේ බාල සහෝදර සහෝදරියන්ගේ අධ්‍යාපනයට සහාය දැක්විමට පටන් ගෙන තිබේ. තවත් අයෙක් තම දෙමාපියන්ගේ ජිවන වෘත්තීය නගා සිටුවිමට සහයෝගය දක්වමන් සිටියි. ඉන් සමහරක් දූ දරුවන් සමාජ විරෝධි ක්‍රියා සඳහා ද යොමු වි තිබේ. දරුවන්ගේ අධ්‍යාපන අයිතිය මෙපරිද්දෙන් කොරෝනා පැහැර ගනිමින් සිටිනු ලබයි. මේ හේතුවෙන් ඉදිරියේ දි ළමා ශ්‍රමිකයන් සංඛ්‍යාව ඉහළ යාමක් සිදු විය හැකි අතර බොහොමයක් සමාජ සංස්කෘතික ගැටළු මෙමඟින් නිර්මාණය විය හැකි වේ. සීමිත ආදායමක් ඇති පවුල්වලට මේ මොහොතේ ඩේටා කාඩ්වලට පවා ගෙවනු ලබන ගාස්තුව දැරිය නොහැකි තරම් වූ බරකි.

ගම්පහ ප්‍රදේශය අධ්‍යාපන කේන්ද්‍රස්ථානයක් වේ. එබැවින් උපකාරක පන්ති සමුහයක් ගම්පහ වටා බිහිවි තිබේ. පාසැල් අධ්‍යාපනයට අමතරව දරුවන් තම දැනුම වර්ධනය කර ගැනිමට සහ විභාග ඉලක්ක කර ගනිමින් උපකාරක පන්ති සඳහා සහභාගි වේ. මෙම උපකාරක පන්ති එලෙසින්ම අන්තර්ජාල පහසුකම් භාවිතයෙන් සිදු කිරිමට එම ගුරුවරුන් උත්සහ කර තිබේ. නමුත් දරුවන්ට මෙමඟින් ආර්ථික සහනයක් ලබා දිමට උපකාරක පන්ති ගුරුවරුන් ඉදිරිපත් වි නොමැත. අධ්‍යාපනය ලබා දිම වෙනුවෙන් මුදලක් තිරණය කර ඇති මෙවන් වකවානුවක එවැනි සේවාවක් බලාපොරොත්තු විය නොහැකි වේ. කෙසේ නමුත්

දරුවන් වෙනුවෙන් උපකාරක පන්ති පවත්වන ගුරුවරුන් තම උපකාරක පන්ති පවත්වමින් සිටිනු ලැබේ. දරුවන්ට අවශ්‍ය වන්නේ නිදහස් මානසික පරිසරක් තුළ තම අධ්‍යාපන කටයුතු සිදු කර ගෙන යාම වේ. නමුත් තම පවුලේ ආර්ථික පසුබිම මේ සඳහා සෘජුව බලපෑම් සිදු කරනු ලැබේ. කොවිඩ් වසංගතය හමුවේ පවුලේ ආර්ථිකය කඩා වැඩි ඇත. යහපත් මානසික පරිසරක් තුළ දරුවන් තම අධ්‍යාපන කටයුතුවලට යොමු කිරිමට දෙමව්පියන් දැඩි උත්සහයක නිරත වේ. ඒ අනුව දරුවන් දැඩි ආතතිකාරක පරිසරයක් තුළ තම ජිවිතය පවත්වා ගැනිමට සිදු වි තිබේ.

මෙම කරුණු සියල්ල එක්ව ගත් කල ළමා ලෝකයේ පැවැති සජිවි බව ළමුන් ගෙන් දුරස් වි ඇත. පූර්ණ පෞරුෂ වර්ධනයක් සඳහා ළමා කාලය ඉතා වැදගත් සාධකයක් වේ. ළමුන්ගේ කායික, මානසික සහ මනෝ සමාජීය සංවර්ධනය සඳහා ඔවුන් විසින් සංවර්ධන අවධින් නිසි පරිදි පූර්ණත්වයට පත් කල යුතු බව සංවර්ධන මනෝ විද්‍යාඥයින් පවසා තිබේ. නමුත් මෙම කොරෝනා වසංගයෙන් ආරක්ෂා විමට දෙමාපියන් නිරන්තරයෙන් තම නිවෙසට වි කාලය ගත කරන ලෙස දරුවන්ට උපදෙස් දි තිබේ. මේ තුළින් දරුවන් මානසික කම්පනයට පත් විය හැකි වේ. සම වයසේ තම යහළුවන් සමඟ කාලය ගත කිරිමට දරුවන්ට අවකාශ නොලැබේ. පරිගණක තිරය මත ඔවුන්ගේ ජිවිතය කේන්ද්‍රගත වි තිබේ. පාසැල් ගුරුවරුන් සහ උපකාරක පන්ති ගුරුවරුන් තම අධ්‍යාපන ඉලක්ක සපුරා ගැනිමට තාක්ෂණික ප්‍රවේශයන් භාවිතා කිරිම විවේචනයට ලක් කල නොහැකි කරුණකි. දීර්ඝ කාලිනව තාක්ෂණික මෙවලම් භාවිතයට ළමුන් හුරු විම ළමා මනසට යෝග්‍ය නොවන බව අප කවුරුත් දන්නා කරුණකි. නැතහොත් දරුවා විවිධ මානසික ආතතින් සහ රෝගබාධවලට ගොදුරු විය හැකි වනවා සේම ඇතැම් විට විවිධ අපචාරවලට යොමු විමේ අවස්ථා ද උදාවේ.

සමස්තයක් ලෙස ගම්පහ ප්‍රදේශය සැලකිමේ දි දරිද්‍රතාවය, නව තාක්ෂණය සමඟ පවතින දුරස්ථ බව, තාක්ෂණික උපකරණ භාවිතයේ පවතින අසමත්කම හෝ එයට අවශ්‍ය දැනුම ළමුන් සහ  දෙමාපියන් සතුව නොතිබිම වැනි අභියෝග දැක ගත හැකි වන අතර මාර්ගගත ඉගැන්විමේ ක්‍රමවේදය ක්‍රියාත්මක කිරිමේ දි ශ්‍රී ලංකාව තුළ පොදුවේ පවතින ගැටළු ලෙස මෙය හැදින්විය හැකි වේ. ස්වයං රැකියාවක් යනු තමා විසින් තමාගේ හැකියාව අනුව යම් භාණ්ඩයක් හෝ සේවාවක් නිෂ්පාදනය කිරිම හෝ අලෙවිකිරිම ලෙස සරලව හඳුන්වා දිය හැකි වේ. මේ සඳහා මුලික ප්‍රාග්ධනය ඉතා අවම මට්ටමක් වන අතර භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය සහ ව්‍යවසායකත්වය යන නිෂ්පාදන සාධක තුලනයකින් කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් ලෙස තම ව්‍යාපාරික අවස්ථා දියුණු කර ගැනිමේ හැකියාව ඔවුන්ට පවතිනු ඇත.

ඕනැම රටක ජීවනාලිය එහි කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවෝ ය. ලෝකයේ සංවර්ධිත රටවල් ඒ තත්ත්තවයට පත් විමට මුලික වි ඇත්තේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් දැක්වූ දායකත්වය වේ. පශ්චාත් කොවිඩ් වසංගත කාලයේ දි ජන ජිවිතය සහ ආර්ථිකය ශක්තිමත් කිරිමට සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකින් ශක්තිමත් කළ යුතුව ඇත. ගම්පහ ප්‍රදේශයේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් මෙන්ම ස්වයං රැකියාලාභීන් විශාල ප්‍රමාණයක් තම වෘත්තීන් හි නියැලි සිටිනු ලබයි. ගම්පහ ප්‍රදේශයේ පාර දෙපස යම් යම් නිෂ්පාදන භාණ්ඩ තබා ගනිමින් අලෙවි කරන වෙළදාම්කරුවන් මෙන්ම රාත්‍රී ආහාර කඩ පවත්වා ගෙන යන්නන් සහ  සුළු පරිමාණයේ හෝටල් පවත්වා ගෙන යන්නන් ඇතුළු පිරිස් කොවිඩ් දෙවන රැල්ලත් සමඟ දැඩි අපහසුතාවයකට ලක් විය. මාලු අලෙවිය නතර විම නිසා දහස් ගණනින් සුළු පරිමාණ ව්‍යාපාරිකයන් අසිරුතාවයන්ට පත් විය. මෙම පිරිස් බොහොමයක් දෛනිකව තම ආදායම උපයා ගන්නා අතර ඉතුරුම් ප්‍රමාණය ඉතා අවම මට්ටමක පවතියි. කොවිඩ් වසංගතය හමුවේ රජය විසින් ඉදිරිපත් කළ

සෞඛ්‍ය මාර්ගෝපදේශණයන් පදනම්ව තම ජීවිකාව පවත්වා ගැනිමේ දැඩි අර්බුදයක මෙම ස්වයං රැකියාලාභීන් මුහුණ පා සිටියි.

සිසුයෙන් දියුණු වන ප්‍රදේශයක් වූ ගම්පහ ප්‍රදේශයේ සුපිරි වෙළඳසැල් ජාලය හමුවේ අසරණ වී සිටි මෙම ස්වයං රැකියාලාභීන් කොවිඩ් වසංගතය හමුවේ තම දෛනික පාරිභෝගික ජනතාව ඔවුන් කෙරෙන් දුරස් විය. තාක්ෂණික ක්‍රමවේදයන් ඔස්සේ නාගරික ජනතාව තම අවශ්‍යතා සුපිරි වෙළඳ සැල් ජාලය ආශ්‍රීතව ඉටු කර ගත්තත් ස්වයං රැකියාලාභීන් සහ ඔවුන්ගේ පාරිභෝගික ජනතාව දැඩි පීඩනයකට එමගින් ලක් වී තිබේ. ලබා ගත් ණය පියවා ගැනිමට සරිලන ආදායමක් නොලැබෙන මෙවන් වකවානුවක තම දෛනික ජිවිතයේ ආර්ථික ගැටළු හේතුවෙන් කෙසේ හෝ යම් මූල්‍යමය වාසියක් ලබා ගැනිමට පුද්ගලයින් පෙළෙඹේ. මෙහිදි මුදල් ලබා ගන්නා මූලයන් ඔවුන්ට එතරම් වැදගත් නොවේ. සමාජ විරෝධි ක්‍රියා සහ අපරාධ සඳහා පුද්ගලයින් යොමු වන්නේ මේ නිසාවෙනි. ගම්පහ ප්‍රදේශය තුළ සොරුන් බහුල වී ඇති බව ගම්පහ ප්‍රදේශය භාර වැරල්ලවත්ත පොලිස් ස්ථානය මඟින් තොරතුරු වාර්තා වී තිබේ. දියුණු රටවල ස්වයං රැකියාලාභීන්ට රජය විසින් මාසික දිමනාවක් ගෙවනු ලබන අතර ශ්‍රී ලංකාවේ එවැනි වැඩ පිළිවෙලක් සකස් කර නොමැත. අඩු ආදයම්ලාභීන්ට රු. 5,000.00ක දිමනාවක් ගෙවනු ලැබූ අතර අද වන විට එය රු. 2,000.00 දක්වා අඩු වී ඇත. එබැවින් රජය විසින් මේ සඳහා අවධානය යොමු කර මොවුන් ක්‍රමානුකූලව ලියාපදිංචි කරවා යම් උත්තේජන පැකේජයක් හඳුන්වා දිම ඉතා වැදගත් වන අතර එසේ නොමැති වුවහොත් බරපතල සමාජ ගැටළු නිර්මාණය විමට බොහෝ විට ඉඩ තිබෙනු ඇත.

පාසැල් ළමුන්ට හා ස්වයං රැකියාවන් හි නියුතු වුවන්ගේ පවුල් ඒකකවලට සිදු වී ඇති ගැටළු විසඳා ගැනිමට කටයුතු කිරිම

හදිසි ආපදා තත්ත්වයක දි ශ්‍රී ලංකාව තුළ පළමුවෙන් සිදු වන්නේ පාසැල් වැසිමයි. ගංවතුර තත්ත්වයක දි හෝ නාය යාමක දි වුවත් පාසල් වසා තැබිමට රජය විසින් කටයුතු කරනු ලබයි. මේ සඳහා හේතු වන්නේ විපතට පත්වන අයට නවාතැන් ලබා දිමට පාසල භාවිතා කරන බැවිනි. කොවිඩ් වසංගතයත් හදිසි ආපදා තත්ත්වයක් ලෙස හඳුනාගත හැකි වේ. නමුත් මේ අවස්ථාවේ දි පාසලත් විපතට පත් වී තිබේ. ඒ නිසාවෙන් ම පාසැල මෙන්ම පාසැල් දරුවන් අප විසින් ආරක්ෂා කර ගත යුතු වේ. දැනුම පදනම් කර ගත් සමාජයක් සඳහා යන ගමනේ දි රටේ පාසැල් පද්ධතිය ආරක්ෂා කර ගැනිම අනාගතය ශක්තිමත් කිරිමක් ලෙස හදුන්වා දිය හැකි වේ. මාර්ගගත අධ්‍යාපන ක්‍රමය අයහපත් දෙයක් නොවේ. ගැටළුව වන්නේ ඊට අවශ්‍ය යටිතල පහසුකම් සකස් කිරිමයි. කොවිඩ් හමුවේ නිදුශීලි ප්‍රතිපත්තියක් අනුගමනය නොකොට මේ සඳහා අවශ්‍ය වේදිකාව (Platform) නිර්මාණය කර ගත යුතු වේ. මේ සඳහා අධ්‍යාපනවේදින්, විද්වතුන්, ප්‍රවිණයන් එකතු වි මේ සඳහා ගැලපෙන වේදිකාව (Platform) නිර්මාණය කර ගත යුතු වේ. මෙයට සමාජ වැඩකරුවන් ලෙස ඉහළ දායකත්වයක් ලබා ගත හැකිය. පුද්ගලයාගේ, සමාජයේ සහ ප්‍රජාවගේ ගැටළු හඳුනා ගනිමින් ඒ සඳහා විසදුම් යෝජනාවලියක් ලබා දිමට වෘත්තිය මැදිහත්විමක් සමාජ වැඩකරුවන්ට සිදු කළ හැකි වේ. ආර්ථිකය කඩා වැටිම නිසා දරුවන් මෙන්ම දෙමාපියන්ගේ ද බලාපොරොත්තු සුන් වි දැඩි ලෙස ඉච්ජාභංගත්වයට පත් වි සිටින මෙවන් අවස්ථාවක මිනිසුන්ට තම ජිවන ගැටළු විසඳා ගැනිමට උදව් කරනු ලබන විද්‍යාත්මක ප්‍රවේශයක් සඳහා යොමු විම ඉතා වැදගත් වේ. එමගින් පුද්ගලයා සවිබල ගන්වා ඔවුන්ගේ ආර්ථික, සමාජිය, මානසික පරිසරය ශක්තිමත් කර පවුල් ඒකකය ගොඩනංවමින් සමාජ ව්‍යුහය නැවත සකස් කර ගැනිමට මඟ පෙන්විමක් සිදු කළ හැකි වේ. මේ සඳහා සමාජ වැඩ කරුවන්ගේ කාර්ය භාර්ය ඉතා වැදගත් වේ.

## සමාජ වැඩ ප්‍රවේශයන් භාවිතයේ යෙදවීම

පුද්ගලයාට ඔහුගේ ජීවන කාර්යයන් කිරීමට ඇති අපහසුතා මග හැරවීම සහ ඔවුන්ගේ අභිමාර්ථ වටිනාකම් අවබෝධ කර ගැනිමට අවස්ථාව ලබා දීමත් ඒ සඳහා අන්තර් පුද්ගල ක්‍රියා සහ සමාජ පරිසරය පිළිබඳ අවධානය යොමු කිරීමත් වැදගත් වේ. එමෙන්ම රටක ජනතාවගේ පොදු ජීවන මට්ටම පවත්වා ගැනීම සඳහා පොදුවේ ක්‍රියා කිරීමත් වැදගත් වේ. මෙම කොවිඩ් වසංගතය හේතුවෙන් ගම්පහ ප්‍රදේශය ආශ්‍රිතව සහ සමස්ත රට තුළ පාසැල් ළමුන්ට සහ ස්වයං රැකියාලාභීන්ට පහත සඳහන් ගැටළු පැන නැගි ඇති බව නිරීක්ෂණය විය.

පාසල් ළමුන්

- අධ්‍යාපන උපකරණ සහ පෙළපොත් ලබා ගැනීමේ ගැටළුව
- ආර්ථික දුෂ්කරතා හමුවේ පාසල් දරුවන් පාසැල හැර යාම
- නිවසේ සිට අන්තර්ජාලයට සම්බන්ධ වීමට හැකියාව සීමිත පිරිසකට පමණක් තිබීම
- ගුරු භවතුන් විසින් යොමු කරන දේශන සටහන් සහ පැවැරම් අභ්‍යාස මුද්‍රිත පිටපත් වශයෙන් ලබා ගැනිමට ද දරුවන්ට සිදු වීම

ස්වයං රැකියාලාභීන් ඃ

- දෛනිකව උපයා ගන්නා ආදායම සහ ඉතුරුම් ප්‍රමාණය ඉතා අවම වීම
- නව - තාක්ෂණය සමඟ පවතින දුරස්ථ බව
- දරිද්‍රතාවය

පොදු සාධක ඃ

- තාක්ෂණික උපකරණ භාවිතයේ පවතින අසමත්කම හෝ එයට අවශ්‍ය දැනුම ඔවුන් සතුව නොතිබීම
- මානසික කම්පනයට පත් වීම
- පෞරුෂත්ව අක්‍රමතා ඇති වීම
- විවිධ රෝගා බාධ ඇති වීම
- සමාජ විරෝධී ක්‍රියා සහ අපරාධ සඳහා යොමු වීම

මේ සඳහා ගුරුවරුන් නිර්මාණශීලි වීම වැදගත් වන අතර තමන්ගේ නිර්මාණශීලීත්වය මෙම අධ්‍යාපන ක්‍රමය තුළට ඇතුලත් කළ යුතු වේ. යම් ගැටළුකාරි අවස්ථාවක ක්‍රියාකාරි විය යුත්තේ කෙසේ ද යන්න පිළිබදව සොයා බැලිය යුතු වේ. මේ සඳහා අප භාවිතා කරන තාක්ෂණය තුළම විසඳුම් සොයා ගත හැකි වේ. පාසැල් මට්ටමින් නව තාක්ෂණය ගමට යාමට අවශ්‍ය පහසුකම් සකස් විය යුතු වේ. රජය මැදිහත් විය යුත්තේ මෙම කරුණු ඉටු කිරීමට බවත් මෙහිදි පෙන්වා දීමට කැමැත්තෙමි. එපරිද්දෙන්ම තම දෛනික ජීවිකාව සරිකර ගන්නා ස්වයං රැකියාලාභින් වෙනුවෙන් ඔවුන්ගේ ආර්ථිකය සවිමත් කිරීමට වැඩපිළිවෙලක් සැකසිය යුතු වේ. ඔවුන්ගේ මානසික ගැටළු විමසා බලා ඒ සඳහා විසඳුම් ක්‍රමවේදයක් සකස් විය යුතු වේ. තම පවුල සහ පවුලේ කාර්යභාර්යන් නිසි ලෙස ඉටු වීම මගින් සමාජ යාන්ත්‍රණයේ පැවැත්ම තහවුරු කර ගත හැකි වේ. ඒ නිසාවෙන්ම සමාජ පැවැත්ම තහවුරු කිරීම සඳහා ආර්ථික සහයෝගිතාවය ශක්තිමත් කර කුටුම්භය ආරක්ෂා කළ හැකි නම් මෙවැනි වසංගත කාලයක දි වඩා සවිමත්ව ඒ සඳහා මුහුණ දිය හැකි වේ.

ඒ අනුව දුරස්ථ ඉගෙනුම් වැඩසටහන් සමගින් විවෘත අධ්‍යාපනයට අවශ්‍ය වේදිකා සකස් කරමින් අධ්‍යාපන කටයුතු ඉදිරියට රැගෙන යාමටත් පුද්ගලයා සවිබල ගන්වමින් ඔවුන්ට නැවත සමාජානුයෝජනය සිදු කිරිමට අවශ්‍ය මග පෙන්විමත් සමාජ වැඩකරුවන් ලෙස සිදු කල හැකි බව පෙන්වා දෙමි. මෙම ගැටළු විසඳා ගැනිමට සමාජ වැඩ පසුබිම තුළ සමාජ වැඩ ආකෘතින් සහ ප්‍රවේශයන් භාවිතා කළ හැකි වේ. සමාජ වැඩ පරිසරය තුළ අප සාකච්ජා කරනු ලබන සමාජ වැඩ ආකෘතීන්/ප්‍රවේශයන් බොහොමයක් පවතියි.

- බල ගැන්විමේ ප්‍රවේශය (Empowerment)
- පාරසරික ප්‍රවේශය (Ecological)
- ගැටළු විසදිමේ ප්‍රවේශය (Problem Solving)
- ශක්තිය මුල් කර ගත් ප්‍රවේශය (Strength Based)
- අයිතින් මුල් කර ගත් ප්‍රවේශය (Right Based)
- මනෝගතික ප්‍රවේශය (Psychodynamic)
- අන්තර් ආංශයික ප්‍රවේශය (Intergrated)
- ඒකාබද්ධ ප්‍රවේශය/පද්ධති ප්‍රවේශය (System Based)

සිද්ධි අධ්‍යනයක් ඇසුරින් ඃ

දූෂාන්ත නම් වයස අවුරුදු 45ක් පමණ වු විදුලි කාර්මික ශිල්පියෙක් ගම්පහ, හංසගිරි ප්‍රදේශයේ ජිවත් වෙයි. මෙහිදි ඔහුගේ පෞද්ගලිකත්වයට හානියක් වන බැවින් ඔහුගේ පුද්ගල නම සහ හදුනා ගැනිමේ තොරතුරු පිළිබඳ ව ආදේශක භාවිතා කරන ලදි. විවාහකයෙක් වු දූෂාන්ත දියණියක් සහ පුතුන් දෙදෙනෙකුගේ පියෙකි. තම බිරිඳ නිවසේ වැඩ කටයුතු සිදු කරන අතර දූෂාන්තගේ මව ද සිය නිවසේ ජිවත් වෙයි. දියණිය අ.පො.ස. උ/පෙළ විභාගය අවසන් කර පෞද්ගලික ආයතනයක සේවය කරයි. වැඩිමහල් පුතා අ.පො.ස. ස/පෙළ විභාගය අවසන් කර නිවසේ රැදි සිටියි. බාල පුතා තවම පාසැල් යමින් සිටියි. ඔහු 02 වන ශ්‍රේණියේ ඉගෙන ගනු ලබයි. බෞද්ධයෙක් වු දූෂාන්ත සිය බිරිඳ සමග කිට්ටු සබඳතාවයක් නොපවත්වයි. බොහෝ දිනවල සුළු මත ගැටුම් ඇති වේ. සමහර දිනවල දි පොලිස් ස්ථානයේ පැමිණිල්ලක් දක්වා සිදුවිම දුර දිග යයි. මේ සඳහා හේතුව ලෙස පවසන්නේ බිරිඳ විසින් දූෂාන්තට වෙනත් සබඳතාවයක් ඇති බවට දෝෂාරෝපණය කිරිම බව හඳුනා ගත හැකි වේ. යම් ආර්ථික පසුබිමක් සහිත දූෂාන්තගේ නිවස තවමත් නිම නොවු අතර ඔහු සරල දිවි පෙවතක් ගත කරන පුද්ගලයෙක් බව නිරික්ෂණයට ලක් කල හැකි වේ. කොවිඩ් වසංගතය හමුවේ ඔහුගේ ජිවන වෘත්තිය අඩපණ වි ඇත. පවුලේ සාමාජිකයන් සියළු දෙනා නිවස තුළට කේන්ද්‍රගත වි ඇත. ආර්ථික ගැටළුව මෙම පවුල් ඒකකය තුළ උද්දීපනය වෙද්දි එමඟින් ඇති වන පාරසරික තත්ත්වයන් හමුවේ මානසික ආතතීන් මත පවුල් ගැටළු ඇති වි ඇත. විවිධ වු වයස් මට්ටම්වල පසුවන දරුවන්ගේ මානසික ව්‍යාකුලතා හමුවේ පැන නගින ගැටළු තවත් උග්‍ර අතට හැරි ඇත. මෙම සිද්ධි අධ්‍යයනය තුළ තම ආදායම අහිමි විම සහ පාසැල් දරුවාගේ අධ්‍යාපන කටයුතු ඉදිරියට සිදු කර ගෙන යාමේ ගැටළුව හඳුනා ගත හැකි අතර ඉන් පරිබාහිරව පවුල තුළ අන්තර් සබඳතා පවත්වා ගැනිමේ ගැටළු ද ඇති වි තිබෙන බවත් නිරික්ෂණයට ලක් විය. මේ සඳහා සමාජ වැඩකරුවෙකු ලෙස පහත ප්‍රවේශ ඔස්සේ විසඳුම් යෝජනාවලියක් සකස් කර ගත හැකි වේ.

බලගැන්වීමේ ප්‍රවේශය ඃ

සියලු පුද්ගලයින් සතුව ඔවුන්ට ආවේණික වූ ශක්ති ප්‍රභවයන් ඇති බවත් ඔවුන් වෙනස් කළ හැකි බවත් ඒ අනුව ඔවුන්ගේ ශක්තින් හා හැකියාවන් වෙනස් කරමින් පුද්ගල සංවර්ධනයක් කරා එළඹිය හැකි බවත් පෙන්වා දෙන අතර පවතින ගැටළු හමුවේ එම ශක්තීන් වැසී ඇති බවත් තේරුම් ගත යුතු වේ. සමාජ වැඩකරුවෙකු ලෙස පළමුවෙන් දූෂාන්ත මහතා වෙත නිසි ගෞරවය ලබා දිය යුතු අතර ඔහුගේ අනන්‍යතාවයට ගරු කල යුතු වේ. ඔහු සතුව පවතින සම්පත් හා ශක්තීන් ගවේෂණය කිරිමක් සිදු කර ක්‍රියාකාරි සැලසමක් සකස් කල යුතු වේ. අන්තර් පුද්ගල සම්බන්ධතාවය නැවත ඇති කිරිමට කටයුතු කළ යුතු වේ. ඔහු තම පවුල සහ සමාජය සමඟ පවත්වා ගත යුතු සම්බන්ධතාවය නැවත ගොඩ නැගිමට සහයෝගය සහ මග පෙන්වීම ලබා දිය යුතු වේ. ආදාල ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය සහ දූර්වලතා ඇගයිමකට ලක් කළ යුතු වේ.

මේ සඳහා සම්මුඛ සාකච්ඡා, දැනුවත් කිරිම, නිවාස චාරිකා සහ පුහුණු කිරිමේ වැඩසටහන් වැනි ක්‍රමවේදයන් භාවිතා කළ හැකි වේ. පවතින අවස්ථාවන්වලට පරිබාහිරව විසඳුම් සොයා ගැනිමට පවතින අවස්ථා පුළුල් කල හැකි වේ. මෙහිදි පවුලේ සමාජිකයන් එකතු වි තම ගැටළු සහ එයට ලබා ගත හැකි විසඳුම් සාකච්ජා කිරිමට අවස්ථාවක් උදා කර දිය හැකි වේ. එමගින් අන්තර් සබඳතා ශක්තිමත් කිරිම සහ පුද්ගලයින් තේරුම් ගැනිමට අවස්ථාවක් ලැබෙන අතර ගැටළුවලට මුහුණ දිමට ඔවුන් සතුව පවතින ශක්තින් ඔවුන්ටම අවබෝධ කර දිමට හැකියාව ලැබෙනු ඇත.

පාරසරික ප්‍රවේශය ඃ

පුද්ගලයා පරිසරයේ සමාජිකයෙකු ලෙස සලකා කටයුතු කිරිම මෙම ප්‍රවේශයේ දි සිදු වේ. පුද්ගලයා සහ පරිසරය එනකිනෙකට බැඳි ඇති බැවින් පුද්ගලයාගේ ගැටළුව පරිසරය හා බැඳි ඇති බවත් පරිසරය නිවැරදිව හඳුනා ගැනිම මඟින් පුද්ගල ප්‍රශ්ණ, ගැටළු සහ ඒ සඳහා මුල් වන හේතුන් සියල්ල පරිසරය තුළින් නිරික්ෂණය කළ හැකි බව අවබෝධ කර ගත යුතුව තිබේ.

එබැවින් දූෂාන්තගේ පවුල් පරිසරය යහපත් කිරිමට අවශ්‍ය මග පෙන්වීම ලබා දිය යුතු අතර පුද්ගල වටිනාකම් සහ ඇගයුම් පද්ධතිය එකිනෙකාගේ අවශ්‍යතා මත තුලනය කර ගැනිමක් සිදු කළ යුතු බවත් වටහා දිය යුතු වේ.

මනෝ ගතික ප්‍රවේශය ඃ

පුද්ගලයාට පවතින මානසික පිඩාකාරි බව සහ ආතතිමය තත්ත්වයන් හමුවේ තමා පිළිබඳව නිසි අවබෝධයක් ලබා ගත නොහැකි වේ. ඔහු ශාරිරික, මානසින හා සමාජිය වශයෙන් නිෂ්ක්‍රියත්වයට පත් වන බව මෙම ප්‍රවේශයේ දි අවධාරණය කර තිබේ. මෙහිදි සමාජ වැඩ වෘත්තිකයෙකු ලෙස පුද්ගලයාගේ ශත්කින් හා හැකියාවක් හඳුනා ගැනිම සිදු කළ යුතු වන අතර දූර්වලතා හඳුන්වා දි ඒවා ගොඩ නගා ගැනිමට සහාය ලබා දිය යුතු වේ. පුද්ගලයාගේ ප්‍රජානන හැකියාවන් ඔහුගේ සංවර්ධනය සඳහා යොදා ගැනිමට කටයුතු කල හැකි වේ. පුද්ගලයාගේ පවුල් සාධක සහ පවුල් පසුබිම හදුනා ගෙන පුද්ගල සංවර්ධනය සඳහා යොමු කිරිම මගින් අන්තර් සම්බන්ධතා ගොඩනැංවිම හා පවතින සම්බන්ධතා සංවර්ධනය කිරිම කල හැකි වේ. එමගින් එම සම්බන්ධතා පුද්ගලයාගේ සංවර්ධනය සඳහා භාවිතා කල හැකි වේ.

ගැටලු විසඳීමේ ක්‍රමවේදය ඃ

ගැටලුවක් ඇතිවන්නේ තම අවශ්‍යතා ඉටු නොවීම මතයි. මේ සඳහා විවිධ මතවාදයන්, අනවබෝධය, සමාජ සංස්කෘතික සාධක වැනි දෑ බලපානු ලබයි. සමාජ සහ ආර්ථික සාධක මෙන්ම කායික සහ මානසික සාධක මේ සඳහා හේතු විය හැකි වේ. .

මෙහිදී පහත කරුණු පිළිබඳව සමාජ වැඩ වෘත්තිකයාගේ අවධානය යොමු කිරිම ඉතා වැදගත් වේ.

- ගැටලුවේ ඉතිහාසය
- ගැටළුවට මුල් වු හේතු සාධක
- දැනට ඇති වී ඇති බලපෑම
- වර්තමාන ස්වභාවය
- ගැටළුව සඳහා මැදි වී ඇති පාර්ශවයන් පිළිබඳ ව කරුණු අධ්‍යයනය කිරිම

දුෂාන්ත මහතාගේ ගැටළුව ලෙස හඳුනා ගත හැක්කේ යම් සැලකිය යුතු කාලයක් තම බිරිඳ සමඟ පවතින අනවබෝධය වේ. එමඟින් පවුල් සංස්කෘතිය යහපත් මට්ටමින් ගොඩ නැගී නොමැත. ඇති වී ඇති කොවිඞ් වසංගතය හමුවේ දුෂාන්තගේ රැකියාවේ ඇති වු පසුගාමිත්වය හේතුවෙන් සහ පවුල තුළ එමඟින් පැන නැගුණු මානසික අසහනකාරී තත්ත්වය හේතුවෙන් ඔවුන් දැඩි මානසික කම්පනයට පත් වී ඇත. තම දරුවන් ද නිසි අවබෝධයකින් තොරව කටයුතු කරන බැවින් පාසැල් යන වයසේ සිටින තම පුතා දැඩි ආතතිකාරක චර්යා රටාවක් පෙන්නුම් කරනු ලබයි.

මේ සඳහා නිරික්ෂණය, සම්මුඛ සාකච්ජා, විවිධ වාර්තා හා සංඛ්‍යා ලේඛන මෙන්ම ද්විතිය මුලාශ්‍ර යොදා ගනිමින් ගැටළුවට ලබා දිය හැකි විසදුම් යෝජනාවලිය සකස් කර ගත හැකි වේ.

ශක්තිය මුල් කර ගත් ප්‍රවේශය ඃ

පුද්ගලයා තුළ පවතින ශක්තින් හා ජිවන ඉල්ක්ක හඳුනා ගනිමින් මානව සම්බන්ධතා සංවර්ධනය කරමින් පුද්ගල අභිප්‍රේරණයක් සිදු කළ හැකි බව මෙම ප්‍රවේශයේ දි හදුන්වා දෙනු ලබයි. මෙහිදී අධ්‍යාපනය, හැකියාව, පවුල සහ නෑදෑ පිරිස මෙන්ම තම පරිසරය වැනි සාධක මුල් කර ගත හැකි බවත් පෙන්වා දෙනු ලබයි. දුෂාන්ත සරල දිවි පෙවතක් ගත කරන පුද්ගලයෙක් බව නිරික්ෂණය විය. නමුත් ඔහුගේ චර්යාවන් සහ පුරුදු සිය භාර්යාව ප්‍රශ්න කර සිටියි. එබැවින් පළමුව ඔහු පිළිබඳව නිවැරදි මානයක් සිය භාර්යාව සහ පවුල වෙත අභිප්‍රේරණය කළ යුතු වේ. ඒ සඳහා සම්මුඛ සාකච්ජා ක්‍රමවේදය භාවිතා කළ හැකි වේ.

අයිතින් මුල කර ගත් ප්‍රවේශය ඃ

සෑම පුද්ගලයෙකුටම සමාන අයිතීන් පවතින බවත් ඔවුන්ගේ මූලික අයිතීන් ආරක්ෂා කිරිම මගින් පුද්ගලයා සවි බල ගැන්විය හැකි බවත් මෙහිදී අවධාරණය කරනු ලබයි. මෙහිදී පුද්ගලයාට අධ්‍යාපනය, රැකියාව, නිවාස වැනි දෑ ලබා ගැනිමට අයිතියක් තිබෙන බවත් ඒ සඳහා පුද්ගලයා සවිබලගැන්විය යුතු බවත් පෙන්වා දෙනු ලබයි.

අන්තර් ආංශයික ප්‍රවේශය ඃ

මෙහිදි සමාජ වැඩ ප්‍රවේශ කිහිපයක් එකවර යොදා ගැනිම අදහස් කෙරේ. මෙමගින් පුද්ගලයා, පවුල කණ්ඩායම් සහ ප්‍රජාව සමාජයේ එකම පද්ධතියත් ලෙස සලකා කටයුතු කරනු ලැබේ. පවතින සම්පත්වලින් නිසි ප්‍රයෝජන ලබා ගැනිමට කටයුතු කල යුතු වේ.

දුෂාන්ත මහතාට පවතින ගැටළුව වනුයේ දැඩි ආර්ථික පසුගාමිත්වයයි. යම් අධ්‍යාපන මට්ටමක් ලබා සිටින ඔහු මනා පිරිපුන් පෞරුෂ ලක්ෂණ පෙන්නුම් නොකරයි. සැමවිටම නිහඩතාවය සියළු ගැටළුවලට විසඳුම බව ඔහුගේ නිගමනය වේ. එබැවින් පළමුවෙන්ම දුෂාන්ත මහතාගේ ජීවන ආකල්පය යම් සුබවාදි තලයකට ගැනිමට අපට සිදු වේ. ඔහු තුළ පවතින ඇහුම්කන් දිමේ ගුණාංගය මත ඔහුට නිසි ගෞරවය සහ සැලකිල්ලක් දැක්විය යුතු වේ. මේ සඳහා ශක්තිය මුල් කර ගත් ප්‍රවේශය සහ අයිතීන් මුල් කර ගත් ප්‍රවේශය භාවිතා කළ හැකි වේ. ඉන් පසු ඔහු දැනුවත් කළ යුතු වේ. ඔහුගේ පාරසරික තත්ව විශ්ලෙෂණයක් සිදු කළ යුතු වේ. පවුල හා සමාජ සම්බන්ධතා කෙරෙහි පවතින නොසැලකිල්ල ඉවත ලා තමා සතු ශක්තින් පදනම් ව යමක් කළ හැකි බව දුෂාන්ත සහ ඔහුගේ පවුල වෙත ඒත්තු ගැන්විය යුතු වේ. මේ සඳහා පාරිසරික ප්‍රවේශය භාවිතා කළ හැකි වේ.

මිනිසා සමාජ සත්වයෙක් බවත් සාමුහික පදනම ජිවිතයේ ඉදිරි පැවැත්ම බවත් මිනිස් ආකල්ප සහ සිතිවිලි මත චර්යාව හැඩ ගැසෙන බවත් සාමුහික ප්‍රයත්නයක් තුළින් ගැටළු විසඳා ගත හැකි බවට වු දැනුවත් කිරිමත් සිදු කළ හැකි වේ. මේ සඳහා මනෝ ගතික ප්‍රවේශය යොදා ගත හැකි වේ. තම පරිසර සාධක භාවිතයෙන් පවතින කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ කෙටි කාලින ආදායම් මාර්ග සඳහා සාමුහිකව ප්‍රවේශයක් ලබා ගත හැකි බවත් ඒ සඳහා පවතින රාජ්‍ය සහ පෞද්ගලික අවස්ථා පිළිබඳ ව දැනුවත් කර ඔවුන් සතුව පවතින සමාජ වගකිම පිළිබඳව වටහා දිමෙන් ඔවුන් සතු දක්ෂතා සහ කුසලතා ඇසුරෙන් බලගැන්විමක් සිදු කල හැකි වේ. මේ සඳහා ගැටළු විසදිමේ ක්‍රියාවලිය මෙන්ම බල ගැන්විමේ ප්‍රවේශය භාවිතා කල හැකි වේ.

අඩු ආදායම් ලාභී ජනතාවගේ ආර්ථිකය සවිබල ගැන්විම සහ පාසැල් දරුවන්ගේ අධ්‍යාපන කුසලතා නව මානයකින් ක්‍රියාත්මක කිරිමට ආදාල සංවර්ධන වැඩසටහන් යෝජනා කිරිම සහ ඒ සඳහා සකස් කරනු ලබන සමාජ ප්‍රතිපත්තින් සඳහා සිය දායකත්වය ලබා දිම වෘත්තීය සමාජ වැඩකරුවන් ඉටු කල යුතු සමාජ වගකිමකි. මේ සඳහා පවතින සම්පත් නිසි පරිදි භාවිතයේ යෙදවිම සහ අන්තර් ආයතන සම්බන්ධිකරණයක් සිදු කිරිමේ හැකියාව ද පවතියි.

මෙයට පද්ධති ප්‍රවේශයක් භාවිතා කල හැකි වන අතර සේවාලාභි පද්ධතිය, ඉලක්ක පද්ධතිය, සම්පත් පද්ධතිය, සේවා සැපයුම් පද්ධතිය, පරිසර පද්ධතිය ඇතුලත් ව සියල්ල ඒකාබද්ධව වු විසදුම් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කල යුතු වේ. ස්වයං සංකල්පය යොදා ගැනිම, පවතින සම්පත් නිසි පරිදි භාවිතයේ යෙදවිම, පුහුණු සහ දැනුවත් කිරිමේ වැඩසටහන් යොදා ගැනිම, සම්බන්ධතා භාවිතා කිරිම, නිවාස චාරිකා, වාර්තාකරණය වැනි සමාජ වැඩ උපකරණ භාවිතා කිරිම මගින් සමාජ වැඩකරුවෙකුට මනා වෘත්තිය සම්බන්ධතාවයක් ගොඩ නගා ගත හැකි වේ.

ස්වයං සංකල්පය ඃ

පුද්ගලයාගේ සංවර්ධනය සදහා පුද්ගලයා යොදා ගැනිම මෙමගින් අදහස් වේ. මේ සඳහා දැනුම, කුසලතා, ආකල්ප පදනම්ව පුද්ගලයා සතු ශක්තීන් සහ දුර්වලතා හදුනා ගනිමින් පුද්ගල ගැටළු විසදා ගැනිමට අවබෝධය ලබා දිය හැකි වේ.

පුද්ගලයාට තම උත්සහයෙන් තම ගැටළුවට විසඳුම් සොයා ගැනිමට නොහැකි වූ විට සමාජ වැඩ භූමිකාව තුල සමාජ ප්‍රත්‍යෙක වැඩ ක්‍රමය භාවිතා කල හැකි වේ. මෙය පුද්ගලයාට ලබා දෙන උපකාරාත්මක සේවයකි. මෙහිදි පුද්ගලයා ඍජුව ඉලක්ක කර ගනිමින් ඔහු හා බැඳුණු සංවර්ධන ක්‍රියාවලියක් සිදු කරනු ලබයි.

පුද්ගලයාගේ කායික හැකියාව වර්ධනය කිරිම, ආර්ථික හැකියාව වර්ධනය කිරිම, සමාජයමය හැකියාව වර්ධනය කිරිම, මානසික හැකියාව වර්ධනය කිරිම මේ තුලින් සිදු කල හැකි අතර පුද්ගල පෞරුෂත්වය සංවර්ධනය කර පුද්ගල ශක්තින් හා හැකියාවන් වර්ධනය කිරිමෙන් ස්ව-ශක්තිය පිළිබඳ විශ්වාසය ඇති කල හැකි වේ.

පුද්ගලයා හා පරිසරය අතර මනා සම්බන්ධයක් ඇති කරමින් පවතින සම්පත් සංවර්ධනය කිරිම තුලින් පුද්ගල බාධක ඉවත් කිරිම මගින් පුද්ගලයා සවි බල ගැන්විය හැකි වේ.

කණ්ඩායම් වැඩ ක්‍රමය ද පුද්ගලයාගේ වර්ධනයට වැදගත් වේ. කණ්ඩායමේ වර්ධනයට පුද්ගලයා වැදගත් වේ. මේ සඳහා පවුල ප්‍රබල දායකත්වයක් ලබා දේ. මෙමඟින් ආර්ථික හා සමාජිය අවශ්‍යතාවයන් ඉටු කර ගැනිම, හුදෙකලාව නැති කර ගැනිම, විනෝදය ලබා ගැනිම, පුද්ගල ආරක්ෂාව ලබා ගැනිම, මානසික සහ සමාජිය අවශ්‍යතාවයක් සපුරා ගැනිම වැනි කාර්යයන් තෘප්ත කල හැකි වේ. මෙමඟින් තම ශක්තින් හා හැකියාවන් සඳහා බලපාන සාධක සහ තමාගේ දායකත්වය පුද්ගලයාට නිවැරදිව වටහා ගත හැකි වනු ඇත.

**නිගමනය සහ යෝජනාව**

මෙම වසංගතය එක රැයකින් අවසන් නොවේ. මේ මොහොතේ සිදු කල යුත්තේ කුමක්දැයි නිශ්චය කර ගැනිමට හැකියාවක් නොමැතිව බොහෝ පුද්ගලයින් තම ජිවිතය පවත්වා ගැනිම සිදු කරයි. සමාජ වැඩ වෘත්තිකයා මෙහිදි ඔවුන්ට අදහස් ප්‍රකාශ කිරිමට හා ඔවුන්ට ඇහුම් කන් දිමට වැඩි අවධානයක් යොමු කල යුතු වේ. ඔවුන්ගේ මනස සුබවාදිව වෙනස් කල යුතු වේ.

ඇතැමුන් තම ප්‍රශ්න ප්‍රකාශ කරන අතර තවත් අයෙක් එසේ නොකරයි. මෙම අවස්ථාවේ දි තමන් කරන දේ නිවැරදි යැයි බොහෝ පුද්ගලයෝ කල්පනා කරයි. තමා ගැටළුව හඳුනා ගෙන ඇති ආකාරය නිවැරදි යැයි සිතයි. නමුත් එය වැරදි සහගත විය හැකි වේ. සමාජ වැඩ වෘත්තිකයා මෙය වටහා දිය යුතු වේ ඒ සඳහා මනෝ විද්‍යාත්මක සිද්ධාන්ත කරුණු භාවිතා කල හැකි වේ.

පෙර පරිදිම අවදිවිම, ආහාර ගැනිම, ක්‍රිඩා කිරිම, නියමිත කාල සටහනකට අනුව වැඩ කිරිම මගින් ආතතියෙන් මිදිය හැකි වේ. දරුවන් නිර්මාණාත්මක ක්‍රියා සඳහා යොමු විම. නිවසේ සිට අන්තර්ජාලය භාවිතා කරන අවස්ථාවල දි දෙමව්පියන්ගේ හෝ වැඩිහිටියෙකුගේ සුපරික්ෂාව මත එම කාර්යය සිදු කිරිම වැදගත් බවත් අවධාරණය කල යුතු වේ. පුද්ගලයින් තම වගකිම් හා කාර්ය භාර්යයන් මඟ හැරිමට උත්සහ කරයි. අනුන් මත යැපිමට උත්සහ කරයි. තම දුබලතා හා ගැටළු අනුන් මත පවරා අනුන්ට චෝදනා කිරිමට උත්සහ කරයි.

සමාජ වැඩ වෘත්තීකයා මෙය නිසි පරිදි කළමනාකරණය කල යුතු වේ. ගැටළුව හඳුනා ගනිමින් විසඳුම් ක්‍රියාත්මක කල යුතු වේ. පවතින ගෝලිය අර්බුදය හමුවේ ස්වයං රැකියාලාභින් ඉතා අසරණ තත්ත්වයකට පත් වි ඇත. ඔවුන් නැවත සවි බල ගැන්විමක් සිදු කල යුතුව ඇත. එම පවුල් වල සිටින පාසැල් යන දරුවන් තම දෙමව්පියන්ගේ ආර්ථික දුෂ්කරතා හමුවේ අන්ත අසරණ වි සිටියි. ඔවුන් දැඩි මානසික සහ කායික කම්පනයකට ලක් වි සිටියි. ගම්පහ ප්‍රදේශය මුල් කර ගනිමින් මෙම කරුණු ඉදිරිපත් කලත් දිවයිනේ බොහෝ

ප්‍රදේශයන් හි ස්වයං රැකියා ලාභීන් පමණක් නොව රැකියාවන් හි නියුතු ප්‍රජාව මෙන්ම ව්‍යාපාරික ප්‍රජාව ද දැඩි ආර්ථික සහ මානසික අර්බුදයකට ලක් වී සිටියි. හෙට දවසේ ජීවිතය පිළිබඳ ව යම් බලාපොරොත්තුවක් මත ඔවුන් කටයුතු කරනු ලබයි.

රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන එන්නත්කරණ වැඩසටහන ඉදිරියටත් ක්‍රියාත්මක කරමින් ප්‍රජාවගේ අවබෝධය සමඟින් නිසි සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේදයන් සඳහා යොමු වීමෙන් නැවත අපගේ ජන ජීවිතය වෙත ප්‍රවිෂ්ඨ විය හැකි බවට විශ්වාස කර සිටින අතර එතෙක් සමාජ වැඩකරුවන් ලෙස අප සමාජය මෙන්ම ප්‍රජාව ද ආරක්ෂා කර ගත යුතු බව සිහිපත් කර සිටිමි. ඒ සඳහා සමාජ වැඩකරුවන් ලෙස වෘත්තියමය ප්‍රවේශයක් ලබා ගත යුතු බවත් අවධාරණය කර සිටින අතර ඒ සඳහා ගැටළු හඳුනා ගැනීමේ කුසලතාවය, සැලසුම් කිරීමේ කුසතාවය, සන්නිවේදනය, ඉදිරිපත් කිරීම, සම්බන්ධතා පවත්වා ගැනීම, නිරීක්ෂණය, උපදේශනය, අධ්‍යාපනය, විමර්ශනය, තීරණ ගැනීම, ඇහුම් කන් දීම, විශ්ලේෂණය කිරීම, අවශ්‍ය තැන්හි බලපෑම් කිරීම සහ වාර්තා කිරීම වැනි සමාජ වැඩකරුවෙකු සතු කුසලතා වර්ධනය කර ගත යුතු අතර ප්‍රජාවේ පැවැත්මට ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලියක් තුල තම කාර්යයන්හි නියැලෙමින් ජනතාවගේ සුබසාධනය අරමුණු කර ගනිමන් සමාජ ප්‍රතිපත්ති නිසි පරිදි ස්ථානගත වීමට ක්‍රියාකාරී වෙමින් කටයුතු කල යුතු වේ. ඒ සියල්ල එක්ව ගත් කල නැවතත් ශ්‍රී ලංකාව තුල පිරිපුන් පුද්ගල සමූහයක් සපිරි සමාජ ව්‍යුහයක් නිර්මාණය කර ගත හැකිය.

**ආශ්‍රිත ග්‍රන්ථ**


Retrieved 22.10.2021 from https://cedsrilanka.org ›
Retrieved 24.10.2021 https://wachana.lk/others/others/38/
Retrieved 25.10.2021 https://www.cbsl.gov.lk/,
https://si.wikipedia.org/wiki/